ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.10.07 *චක්‍රලේඛ අංක : 86 / 2026*

***සියලුම මුලස්ථාන/සහය මුලස්ථාන කොමසාරිස්වරුන්***
***සියලුම දිසා බාලදක්ෂ කොමසාරිස්වරුන්***
***සියලුම සහය දිසා කොමාසරිස්වරුන්,***
***සියලුම සුපිපි, සිඟිති, පෝතක, බාලදක්ෂ, මානවක නායක නායිකාවන්***
***සියලුම මානවක බාලදක්ෂ, මානවක බාලදක්ෂ බාලිකාවන් වෙත,***

## <u>බාලදක්ෂ විශේෂ කාර්ය සාධන බලකාය ස්ථාපිත කිරීම</u>

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් ස්ථාපිත කිරීමට අපේක්ෂිත බාලදක්ෂ විශේෂ කාර්ය සාධන බලකාය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ පූර්ව අනුමැතිය ලැබී ඇති බව සතුටින් දන්වා සිටින අතර එම කාර්ය සාධන බලකායට සම්බන්ධ වී කටයුතු කිරීමට කැමති බාලදක්ෂ ව්‍යාපාරය හා සම්බන්ධ මෙහි පහත සුදුසුකම් සපුරන මානවක බාලදක්ෂ, මානවක බාලදක්ෂ බාලිකාවන්ගෙන් සහ සිඟිති, පෝතක, බාලදක්ෂ, මානවක නායක නායිකාවන් හා කොමසාරිස්වරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. අරමුණ

- ලෝක බාලදක්ෂ ව්‍යාපාරයේ මානුෂීය සහන ප්‍රතිපත්තිය හා ඒකාබද්ධව ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් මෙය ක්‍රියාත්මක කරනු ලබයි.
- ශ්‍රී ලංකාව තුල ආපදා තක්සේරුකරණය,ආපදා කළමණාකරණය, හදිසි ආපදා සේවාවන් සැපයීම, පශ්චාත් ආපදා සහන වැඩසටහන්, ඇතුලු ක්ෂේත්‍ර ගණනාවකට අදාලව ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ මඟ පෙන්වීම හා නියමයන් අනුව ක්‍රියාත්මක කරනු ලබන ස්වේච්ඡා ආපදා සහන කණ්ඩායමක් ස්ථාපිත කිරීම.
- ජීවිත ආරක්ෂක සේවාවන් සපයන සක්‍රිය කණ්ඩායමක් ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය තුල ස්ථාපිත කිරීම.
- මානවක බාලදක්ෂ, මානවක බාලදක්ෂ බාලිකාවන්ගෙන් සහ සිඟිති, පෝතක, බාලදක්ෂ, මානවක නායක නායිකාවන් හා කොමසාරිස්වරුන්ගෙන් සමන්විත ඉහත අවස්ථා වලදී පිලිගත් සහන කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි නෛතික පිළිගැනීම හා සමාජ ඉල්ලුම ඇති කණ්ඩායමක් ස්ථාපිත කිරීම.
- ලෝක බාලදක්ෂ සංවිධානය සහ ආසියා ශාන්තිකර බාලදක්ෂ ව්‍යාපාරය විසින් මේ වන විටත් මානුෂීය සහන ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක කරනු ලබන අන්තර්ජාතික පුහුණුවක් හා පිළිගැනීමක් සහිත ආපදා සහන සහ ජීවිතාරක්ෂක කණ්ඩායමක් ස්ථාපිත කිරීම.
- ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය/ ශ්‍රී ලංකා පොලීසිය/ශ්‍රී ලංකා නාවික හමුදාව/ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක බලකාය හා සක්‍රියව සම්බන්ධ වෙමින් විධිමත් පුහුණුවක් ලබා ගනිමින් දේශිය වශයෙන් මෙන්ම විදේශිය වශයෙන් මුහුණ දෙනු ලබන ආපදාවන්හිදී ආපදා සහන සේවාවන් ලබා දීම.

### 02. අයදුම් කිරීම සඳහා වන සුදුසුකම්

- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ මානවක අංශයේ මානවක බාලදක්ෂයෙක් මානවක බාලදක්ෂ බාලිකාවක් හෝ අධිකාරී පත්‍රයක් හෝ සේවා භාර කිරීමේ ලිපියක් හිමි වයස අවු 20 - 40 ත් අතර සිඟිති, පෝතක, බාලදක්ෂ, මානවක නායක නායිකාවක් හෝ කොමසාරිස්වරයෙකු වීම.

- ❖ මනා සෞඛ්‍ය තත්වයෙන් යුතු අයෙකු වීම.
- ❖ විශේෂ කාර්ය සාධන බලකායේ සාමාජිකයෙකු ලෙස අනිවාර්යෙන් ලබා ගත යුතු පුහුණුව ලබා ගැනීමට කාලය කැප කල හැකි අයෙකු වීම.
- ❖ කැඳවනු ලබන ඕනෑම අවස්ථාවකදී ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමට හැකියාව ඇති අයෙකු වීම.
- ❖ විශේෂ කාර්ය සාධන බලකාය සඳහා බඳවා ගැනීමක් සිදු කරනු ලැබුවහොත් අවම වශයෙන් වසර දෙකක් එහි සේවය කිරීමට හැකියාව ඇති අයෙකු වීම.

**03. බඳවා ගැනීම හා පුහුණු ක්‍රමවේදය**

- ❖ මේ සමඟ ඇති අයදුම්පත්‍රය පුරවා 2026.10.25 වන දිනට පෙර ශ්‍රී ලංකා බාලදක්ෂ මූලස්ථානය වෙත යොමු කල යුතු අතර අයදුම්පත් යොමු කරන ලිපි කවරයේ ඉහත වම් කෙලවරේ " බාලදක්ෂ විශේෂ කාර්ය සාධන බලකායට බඳවා ගැනීම - 2026 " ලෙස සඳහන් කර එවිය යුතුය. එයට අතිරේකව https://scout.lk/SSTF යන ගුගල් පත්‍රය පිරවීම මගින්ද අයදුම් කල හැකිය. සියලු අයදුම්පත් " ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්, අංක 65/9, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02" යන ලිපිනයට යොමු කල යුතුය.
- ❖ නියමිත දිනට පෙර අයදුම්පත් යොමු කරන මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරික්ෂණයකට භාජනය කරනු ලබන අතර ඉන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් ශාරිරික යෝග්‍යතා පරික්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලබයි.
- ❖ බාලදක්ෂ විශේෂ කාර්ය සාධන බලකාය සඳහා අදාල මෙහෙයුම් වලට ගැලපෙන ආකාරයේ වෙනම නිල ඇඳුමක් නිර්මාණය කර ඇති අතර, සහන ක්‍රියාන්විතයන්හිදී එකී නිල ඇඳුමින් සහන කටයුතු වල යෙදවීමට සැලසුම් කර ඇත.
- ❖ බාලදක්ෂ විශේෂ කාර්ය සාධන බලකායේ නිත්‍ය සාමාජිකයින් ලෙස බඳවා ගනු ලබන මානවක බාලදක්ෂයින්ට, නායක නායිකාවන්ට හා කොමසාරිස්වරුන්ට තම බාලදක්ෂ නිල ඇඳුමේ පූර්ණ කාලිනව පැලඳිය හැකි පදක්කමක් පිරිනමනු ලබයි.
- ❖ බඳවාගනු ලබන තැනැත්තන් දේශිය හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි.

බාලදක්ෂ විශේෂ කාර්ය සාධන බලකා ප්‍රධානී ලෙස ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් කටයුතු කරනු ලබන අතර එහි සම්බන්ධීකාරක ලෙස සහය ප්‍රධාන කොමසාරිස් (සංවර්ධන/සුභසාධක) කටයුතු කරනු ලබයි. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේනම් සහය ප්‍රධාන කොමසාරිස් දේශාන් මිලින්ද මහතා අමතා ලබා ගත හැකිය (දු.අංක 0740949343).

මෙම ජාතික කර්තව්‍ය සාර්ථක කර ගැනීම සඳහා සියලු පලාත් කොමසාරිස්වරුන් සහ දිසා කොමසාරිස් වරුන් පූර්ණ කැපවීමෙන් කටයුතු කල යුතු බව දන්වා සිටින අතර, දිසාව තුල සම්බන්ධීකරණය සඳහා සහය දිසා කොමසාරිස් (සංවර්ධන) වෙත වගකීම පැවරිය යුතුය.

ස්තූතියි
මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

***නිතිඥ මනෝජ් නානායක්කාර***
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

පිටපත :- ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියලුම කොමසාරිස්වරුන්
පලාත් කොමසාරිස්වරුන් - අවශ්‍ය කටයුතු සඳහා
සභාපති/ගරු විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය